# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 28 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 ජූලි මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 ජූලි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන්
පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2013 අංක 28 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2013 ජූලි මස 08 වැනි දින]

එල්. ඩී.—ඕ. 3/2012.

**2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2013 අංක 28 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** 2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත මෙයින් ඉවත් කරනු ලැබේ. — 2002 අංක 22 දරන පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය පනත ඉවත් කිරීම.

**3.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය අරමුදලේ බැරට පවතින්නා වූ සියලු මුදල් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි ඒකාබද්ධ අරමුදලට මාරු විය යුතු ය. — පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය අරමුදලේ පැවැති මුදල් ආදිය ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබිය යුතු බව.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවත්නා වූ පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය වෙත පවරා ඇති හෝ ඒ මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති හෝ අත්කරගෙන ඇති හෝ ඒ මණ්ඩලයට බදු දී ඇති හෝ ඒ මණ්ඩලය විසින් බැහැර කරනු ලැබිය හැකි හෝ ඒ මණ්ඩලයේ සන්තකය යටතේ හෝ පාලනය යටතේ පැවති යම් චංචල හෝ නිශ්චල දේපලක්, ඒ දේපලට සම්බන්ධ යම් නියම හා කොන්දේසිවලට යටත්ව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට බලපැවැත්වෙන පරිදි, පාර්ලිමේන්තුව වෙත පවරා දී ඇති හෝ පාර්ලිමේන්තුව විසින් මිලදී ගෙන හෝ අත්කරගෙන ඇති හෝ පාර්ලිමේන්තුවට බදු දී ඇති හෝ පාර්ලිමේන්තුව විසින් බැහැර කරනු ලැබිය හැකි හෝ පාර්ලිමේන්තුවේ සන්තකය හෝ පාලනය යටතේ පවතින්නා වූ දේපලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 007298—3,340 (2013/06)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.